# ලාක්ෂා කලාවේ සංස්කෘතිකමය පැතිකඩ හා උරුමයක් ලෙස කළමනාකරණය : මාතලේ දිස්ත්‍රික්කයේ හපුවිද ග්‍රාමය ඇසුරෙනි

ඕ. පී. එන් දර්ශනී

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

---

ලාක්ෂා මහනුවර රාජධානිය හා බැඳෙන සම්ප්‍රදායික කලාවකි. වර්තමානයේ දියුණු තාක්ෂණික ක්‍රම හේතුවෙන් සාම්ප්‍රදායික දේශීය ලාක්ෂා ලබාගැනීමේ ක්‍රමෝපායයන් අභාවයට ගොස් ඒ වෙනුවට ආනයනය කරන ලද ලාක්ෂා ආදේශ වී තිබේ. වාණිජවාදී ආර්ථිකය හමුවේ ලාක්ෂා කලාව බිඳවැටීම යන කරුණ පදනම් ව සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තය පිළිබඳව විමසීමක් හා උරුමයක් වශයෙන් එය කළමණාකරණය වීම පිළිබඳව අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම මෙහි අරමුණ වේ. මෙම විමර්ශනය මාතලේ දිස්ත්‍රික්කයේ හපුවිද ග්‍රාමයේ ලාක්ෂා කර්මාන්තය මත පදනම් විය. මෙහිදී පුස්තකාලය ඇසුරින් පූර්ව පර්යේෂණ සහ එම ග්‍රාමවාසීන්ගෙන් ලබාගත් අත්දැකීම් පාදක කරගනු ලැබිණි.

උක්ත අභිප්‍රාය යටතේ කරුණු විමර්ෂණය කිරීමේ දී කරුණු කිහිපයක් අවබෝධ කරගැනීමට හැකි විය. ලාක්ෂා කලාවේ ආර්ථිකමය බිඳවැටීම සඳහා වාණිජවාදී ආර්ථිකය හේතු වී තිබෙන බව පැහැදිලිවම හඳුනාගත හැකි විය. එමෙන්ම අලෙවිය තුළ පවත්නා දුර්වලතාවයන් ද ඒ සඳහා බලපා තිබේ. බටහිර සංස්කෘතික ආගමනයන්ට පෙර සිංහල සංස්කෘතියේ ගති සොබා පෙන්නුම් කරන බෞද්ධ පදනමක් මත ස්ථාපිත වූ ලාක්ෂා කලාව මහනුවර පල්ලේ හපුවිද ග්‍රාමය තුළ වර්තමානයේත් දක්නට ලැබීම විශේෂිත ලක්ෂණයකි.. සාම්ප්‍රදායික ලාක්ෂා ලබාගැනීමේ ක්‍රියාවලියට අනුව ලාක්ෂා ලබාගැනීමක් සිදු නොවුණ ද ආනයනය කරන ලද ලාක්ෂා මගින් කලාව ඉදිරියට ගෙන යාමට ශිල්පීන් දැඩි අරගලයක නියුතු වේ. එමෙන්ම එම කලා ශිල්පීන් අතර ලාක්ෂා සම්බන්ධව භාවිත වනුයේ ද ඔවුනටම ආවේනික භාෂාවකි. දේශීය අනන්‍යතාව හෙළිකරන මෙවන් විශිෂ්ඨ කලාවක් වාණිජවාදී කෘෂි වැවිලි ආර්ථිකය හමුවේ අඩු තක්සේරුවකට ලක්වී තිබේ. එම නිසා උරුමයක වශයෙන් අනාගතයට පවරනු වස් ලාක්ෂා කලාවේ සංස්කෘතික වටිනාකම් රැකගනිමින් ශිල්ප ක්‍රමය හා ශිල්පීන් ද රැකගැනීමට උචිත යෝජනාවලියක් සැකසීම ද අනාගත අරමුණක් වේ.

ප්‍රමුඛ පද : ලාක්ෂා කලාව, හපුවිද ග්‍රාමය, ශිල්පීන්, වාණිජවාදී ආර්ථිකය